# පටිච්චසමුප්පාදය (තුන්වෙනි කොටස)
## 27.04.2019 - ශ්‍රී ලංකාරාමය
## නුවරඑළිය

හොඳයි හැම දෙනාටම තෙරුවන් සරණයි! යහපතක් වේවා! මේ වෙලාවේ අපි මේ පින්වතුන්ට කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නේ පටිච්චසමුප්පාදයේ තවත් සන්ධියක් පිළිබඳවයි. ඉතිං අද මේ පටිච්චසමුප්පාද ධර්ම කොටස් ටික මේ පින්වතුන්ට මේ අවස්ථාවට ගැලපෙන අයුරින් අපි කියලා දෙන්න බලාපොරොත්තු වෙනවා. මේ ධර්ම කාරණා ටික, මේ ධර්ම කොට්ඨාසයන් සැම දෙනාටම යහපත්ව වැටහේවා! යහපත්ව අවබෝධ වේවා! හොඳට තේරුම් ගන්න ලැබේවා! ආකූල ව්‍යාකූල ස්වභාවයකින් තොරව මේ ධර්ම කාරණය තේරුම් අරගෙන සැම දෙනාටම එය මාර්ගයක් මනසිකාරයක් කරගෙන අමාමහ නිවනින් සැනසෙන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මේ ධර්මය ඇසීම මේ ධර්මය හිතීම මේ ධර්මය මෙනෙහි කිරීමම නිවන් මාර්ගයක්, භාවනාවක්. ආන්න ඒක හිතේ දරාගෙන මේ කාරණය අහන්න.

ගිය පාර අපි **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** = කොහොමද අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර හැදෙන්නේ කියන කාරණය තමයි කථා කළේ. ඒ තමයි පුණ්‍යාභිසංස්කාර - අපුණ්‍යාභිසංස්කාර - ආනෙඤ්ජාභිසංස්කාර. මේක තවත් විදියකට කියලා දුන්නා. ඒ තමයි කාය සංඛාර - වචී සංඛාර - චිත්ත සංඛාර. ඔන්න ඔය දෙකේ වෙනස මම කියලා දුන්නා.

පුණ්‍යාභිසංස්කාර - අපුණ්‍යාභිසංස්කාර - ආනෙඤ්ජාභිසංස්කාර කියලා කිව්වේ සංස්කාරවල තිබෙන ගුණ (quality) වශයෙන්. පුණ්‍යාභිසංස්කාර වල පුණ්‍යය ගතිය තිබෙනවා. අපුණ්‍යාභිසංස්කාර කියල කියන්නේ අපුණ්‍යය quality තිබෙනවා. ආනෙඤ්ජාභිසංස්කාරවල වඩා වැඩි, හෙලවෙන්නේ නැති high quality එකක් තිබෙනවා. ඒක නිසා පුණ්‍යය - අපුණ්‍යය - ආනෙඤ්ජ කියන තැන් වල ඇතිවෙච්ච ශක්තීන් මුල් කරගෙන තමයි මේ නම් දාල තිබෙන්නේ.

ඇයි කාය සංඛාර - වචී සංඛාර - චිත්ත සංඛාර කියලා කිව්වේ? කුමක් මුල් කරගෙනද? ඒ තමයි සංස්කාරයෝ නිෂ්පාදනය වෙන දොරටු මුල් කරගෙන.

අද කියලා දෙන්නේ **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන එක. සරලව කියනවා නම් අවිද්‍යාව නිසා - නොදන්නා කම නිසා - නොතේරෙන කම නිසා අපි දැන් පුණ්‍යාභිසංස්කාර - අපුණ්‍යාභිසංස්කාර - ආනෙඤ්ජාභිසංස්කාර එකතු කරලා රැස් කරලා තිබෙන්නේ. ඒවා වඩාගෙන තිබෙන්නෙත් කයින් වචනයෙන් හිතින්. දැන් ගොඩක් සංඛාර එකතුවෙලා තිබෙනවා.

සංස්කාර (සංඛාර) කියලා කියන්නේ මොකක්ද? අපි හිතමු අපි බෝලයකට හුළං පුම්බනවා කියලා. ඒ කියන්නේ සංස්කාර හදනවා කියලා කියන එක. දැන් සංස්කාර එකතු කරලා එකතු කරලා තිබෙනවා. ඒකෙ වායුව එකතු වෙලා තිබෙනවා. දැන් මේ

එකතු වෙච්ච දේවල් වලින් මොකක්ද ඊළඟට බලාපොරොත්තු වෙන්නේ? කොයි වෙලාවක හරි ඒක පුපුරලා යනවා. බැලුම් බෝලයකට වායුව පිරෙව්වහම කොයි වෙලාවක හරි අවස්ථාව ආපු ගමන් - heat වෙච්ච ගමන් - තුවාල වෙච්ච ගමන් - පරිසරය හැදිච්ච ගමන් ඒක පුපුරලා යනවා. පුපුරලා යෑම සිද්ධ වෙන්නේ කුමක් නිසාද? ඒකට වායුව පුරවපු නිසා. නැත්නම් ඒක වෙන්නේ නෑ. ආන්න ඒ වගේ අවිද්‍යාව කියන ධර්මය හේතුවෙලා අපි කුසල අකුසල නැත්නම් පිං පවු ගොඩක් දැන් වඩලා තිබෙන්නේ. දැන් ඒකට වේලාව ආපු ගමන් ළඟ හෝ දුර හෝ විපාක එන එක තමයි තිබෙන්නේ.

මේ සංඛාර කියන වචනය **'සංඛත සංඛාර' 'අභිසංඛත සංඛාර' 'අභිසංඛරන සංඛාර' 'පයෝගාභි සංඛාර'** කියලත් තිබෙනවා.

හේතුවකින් ප්‍රත්‍යයකින් හටගත්ත ගෙවල් දොරවල් ගස් ගල් පර්වත අපේ ශරීර ඇතුළු සියලුම දේට පොදුවේ කියනවා **සංඛත සංඛාර** කියලා.

1) **සංඛත සංඛාර** = ගස් - ගල් - පර්වත - ඉර - හඳ - තාරකා - ගංගා - ඇල - දොල - ඇඳුම් - පැළඳුම් - ගෙවල් - දොරවල්.

2) **අභිසංඛත සංඛාර** = ඉස්සර කරපු පව් පිං වල කර්ම විපාක හැටියට හැදිලා තිබෙන ඇස් කන් නාසය ආදී තිබෙන සියලුම දේ.

අපේ ඇඟවල්, ඇස්, කන්, නාස ආදිය හැදෙන්නේ ගස් ගල් හැදෙන විදියට නොවෙයි. ඊට වෙනස් ආකාරයකටයි. ඒක නිසා ඒවාට තිබෙනවා විශේෂිත ආකාරයක්. දැන් මේ අය සිල් රෙදි පොරවාගෙන ඉන්නවා. සිල් රෙදි සංඛත සංඛාර වෙනවා. 'කය' **අභිසංඛත සංඛාර** වෙනවා. ඇසට කණ්නාඩියක් දාගෙන ඉන්නවා. කණ්නාඩිය සංඛත සංඛාර වෙනවා. 'ඇස' **අභිසංඛත සංඛාර** වෙනවා.

අපේ ජීවිතියේ මේ සිල් රෙදි ඒවාගේම දාගෙන ඉන්න කණ්නාඩි ආදිය හැරුනහම ඇස කන නාසය දිව ශරීරය යන අභිසංඛතය ආශ්‍රය කරගෙන ඇතුලේ තවත් තිබෙනවා ඉස්සරහට මේ වගේ දේවල් හදන්න පුළුවන් energy එකක්. ඒකට කියනවා **'චේතනාව'** කියලා. ඒකෙන් තමයි නැවත ඉස්සරහට හදන්නේ (අභිසංඛරන සංඛාර).

3) **අභිසංඛරන සංඛාර** = **'චේතනාව'** හෙවත් කර්ම රැස් කිරීමේ ස්වභාවය.
4) **පයෝගාභී සංඛාර** = වීර්ය

දැන් මෙතැන තිබෙනවා සංඛාර වර්ග හතරක්. දැන් **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියන තැනට මෙයින් කොයි එකද අයිති වෙන්නේ? එතැනදී අයිති වෙන්නේ **අභිසංඛරන සංඛාර.** අවිද්‍යාව නිසා තමයි කර්ම රැස් කළේ. දැන් අවිද්‍යාව නිසා සංඛාර හැදිලා තියෙනවා.

අවිද්‍යාව නිසා හැදිලා තිබෙන සංඛාර තමයි **පුඤ්ඤාභිසංස්කාර - අපුඤ්ඤාභිසංස්කාර - ආනෙඤ්ජාභිසංස්කාර.** මේ හැම එක්කෙනාගේම හිත්වල එක එක level වල සංඛාර ගොඩ ගැහිලා තිබෙනවා. නමුත් කොච්චර තිබෙනවද බලන්න බෑ. නමුත් අපේ ජීවිතියට

සම්බන්ධ වෙලා යම් ආකාරයට තිබෙනවා. දැන් අපි මේ කිව්වේ **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියන තැන.

හොඳයි, දැන් **අභිසංඛරන සංඛාර** හැදිලා හැදිලා load එකක් තිබෙනවා. ඒ load එක නිසා දැන් හැදෙනවා විඤ්ඤාණ. **අභිසංඛරන සංඛාර** වලින් පිං පවු රැස් වෙනවා. පිං පවු රැස් වෙන තැන අපිට විපාක ඒ වේලාවේම හැදෙන්නේ නෑ, ළඟ හෝ දුර හෝ වෙලාවක විපාකය හැදෙනවා. විපාක හදන ශක්තිය මේ සිත්වල තිබෙනවා.

අපි කිව්වා 'චිත්ත' 'චෛතසික' 'රූප' 'නිබ්බාන' කියලා ධර්ම ස්වභාව හතරක් තිබෙනවා කියලා. සිත් 89 තිබෙනවා කියලත් කිව්වා. චෛතසික 52 ක් රූප 28 සහ නිවන තිබෙනවා කියලත් කිව්වා. මේ සිත් 89 යම කර්ම හදන සිත් නොවෙයි. මේවා අතර තිබෙනවා කර්මය හැදෙන සිත්. ඒවාට කියනවා **කර්ම විඤ්ඤාණ** කියලා. **විපාක විඤ්ඤාණ** වෙනයි. **කර්ම විඤ්ඤාණ** වෙනයි. මේ 'කර්ම සිත්' සහ 'විපාක සිත්' මුළු සිත් 89 යට ඇතුලත්.

<u>කර්ම හදන සිත්</u>

| | |
|---|---|
| අකුසල් සිත් | 12 |
| කාමාවචර කුසල් සිත් | 8 |
| රූපාවචර කුසල් සිත් | 5 |
| අරූපාවචර කුසල් සිත් | 4 + |
| | 29 |

සිත් 89 යෙන් මේ සිත් 29 කර්ම හදනවා. මේ සිත් 29 සතර ආකාරයකට කර්ම හදනවා. **අකුසල්** වශයෙන් කර්ම හදනවා. **කුසල්** වශයෙන් කර්ම හදනවා. **රූපාවචර** ධ්‍යාන වශයෙන් කර්ම හදනවා. **අරූපාවචර ධ්‍යාන** වශයෙන් කර්ම හදනවා. මේවා සියල්ල පොදු වශයෙන් ගත්තහම කර්ම හදන සිත් = (කර්ම විඤ්ඤාණ). දැන් 29 ආකාරයකට ගොඩගහ ගත්තු ටිකක් තිබෙනවා. මේ ටික එක පාරටම විපාක දෙන්නේ නෑ. අකුසලය විපාක දෙන්න වේලාවක් ඕනෑ. කුසලය විපාක දෙන්න වෙලාවක් ඕනෑ, තැනක් ඕනෑ. හැම එකකටම තැනක් වේලාවක් ඕනෑ. ඒක නිසා වර්ග හතරක කර්ම රැස් උනාට එක පොදියට විපාක දෙන්නේ නෑ. මේ සිත් අස්සේ **අභිසංඛරන සංඛාර** තිබෙනවා. **අවිජ්ජා පච්චයා සඞ්ඛාරා** කියලා කළේ 29 ආකාරයකට විපාක ශක්තිය තිබෙන හිත් හදපු එක.

ඊළඟට බලමු විපාක වශයෙන් තිබෙන සිත්.

| | |
|---|---|
| අහේතුක කුසල විපාක | 8 |
| අහේතුක අකුසල විපාක | 7 |
| කාමාවචර කුසල විපාක | 8 |
| රූපාවචර විපාක | 5 |
| අරූපාවචර විපාක | 4 |
| | 32 |

මෙන්න මේ සිත් 32 තමයි **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැනට එන්නේ. කර්ම රැස් කරන සිත් 29 යෙන් විපාක සිත් 32 හදලා දෙනවා. මේකට කියනවා සංස්කාර නිසා විඤ්ඤාණ හැදෙනවා කියලා. මේ විපාක විඤ්ඤාණ 32 කර්ම හදන ශක්තිය නෑ. මේවා කර්ම වල result එකක් හැටියට හැදෙන ඒවා.

මේකට ලේසියෙන්ම දෙන්න පුළුවන් උදාහරණයක් තමයි චක්ඛු විඤ්ඤාණය. චක්ඛු විඤ්ඤාණය කියලා කියන්නේ මේ විපාක සිත් 32 න් එකක්. ඒවගේම සෝත විඤ්ඤාණය - ඝාණ විඤ්ඤාණය - ජිව්හා විඤ්ඤාණය - කාය විඤ්ඤාණය යන සිත් කර්ම සිත් නොවෙයි. ඉස්සෙල්ලා කරපු කර්මයක ප්‍රතිඵලයක් හැටියට ලැබෙන විපාක සිත්.

- විපාක සිත් වල චක්ඛු විඤ්ඤාණ දෙකක් තිබෙනවා. එකක් **කුසල විපාක** චක්ඛු විඤ්ඤාණය. අනිත් එක **අකුසල විපාක** චක්ඛු විඤ්ඤාණය. ඒක නිසා සමහර චක්ඛු විඤ්ඤාණ පහළ වෙන්නේ අකුසලයක් හින්දයි. සමහර චක්ඛු විඤ්ඤාණ අපිට පහළ වෙන්නේ කුසලයක් හින්දයි.
- සමහර සෝත විඤ්ඤාණ පහළ වෙන්නේ අකුසලයක් හින්දයි. සමහර සෝත විඤ්ඤාණ අපිට පහළ වෙන්නේ කුසලයක් හින්දයි.
- ඝාණ විඤ්ඤාණත් සමහර විට පහළ වෙන්නේ කුසලයක් නිසා සමහර විට අකුසලයක් නිසා. ඒක හොඳට තේරුම් ගන්න.
- ජිව්හා විඤ්ඤාණ අපිට පහළ වෙන්නේ සමහර වෙලාවට කුසලයක විපාකයක් හැටියට. සමහර වෙලාවට අකුසලයක විපාකයක් හැටියට.
- ඊළඟට අපිට පහළ වෙන කාය විඤ්ඤාණයත් සමහර විටෙක කුසල විපාකයි සමහර විටෙක අකුසල විපාකයි.

දැන් මෙහෙම බලන්න. මහා යක්ෂ රූපයක් අපිට දකින්න ලැබෙනවා. ඒ යක්ෂ රූපය දකින්න ලැබෙන්නේ අකුසලයක විපාකයක් හැටියට. අපි රෑ හොල්මනක් දකිනවා. ඒකත් දකින්නේ අපි කරගත්ත අකුසලයක විපාකයක් හැටියට. ඒවගේම මරණයට පත් වෙලා ඉදිමිලා නාසයෙන්ද කටින්ද ඇහෙන්ද කන් දෙකෙන්ද සැරව ගලන්නා වූ විරූපී වූ භයංකාර වූ දිව එළියට අවාවූ අපාට වෙච්ච විකුර්ති වෙච්ච මළ මිනියක් දකින්න හම්බ වෙනවා. ඒක දකින්න ලැබෙන්නේ පෙර පිනක් හින්දද? නෑ. ඒක අකුසලයක විපාකයක්. ඒක නිසා ඒකට කියනවා **අකුසල විපාක චක්ඛු විඤ්ඤාණයක්** කියලා.

මේක තේරුම් ගන්න, අපි හිතමු නවසීලන්තයේ හරි ඔස්ට්‍රේලියාවේ හරි උදේ පාන්දරට අපි ඇවිදගෙන යනවා. ඇවිදගෙන යනකොට අපි හිතාගෙන යනවා 'අපි නවසීලන්තයට ආවේ යම් කිසි පෙර කුසලක ආනිසංසයක් නිසා, විපාකයක් නිසා, ලංකාවේ හිටියා නම් අපිට හරි කරදර, දාඩිය දානවා, වාහනේ හිර වෙලා යන්න තිබෙන්නේ, මෙවගේ යන්න පාරක් නෑ' කියලා. ඔහොම කියා කියා යනකොට සුදු නෝනා කෙනෙක් බල්ලෙකුත් එක්කරගෙන යනවා. ඒ බල්ලා අපි ළඟම ජරා කරනවා. ඒ නෝනා ඒ ජරාව බෑග් එකකට ගන්නවා අපි අමු අමුවේ දකිනවා. ඒ බලු ජරාගොඩ දකින්නේ පෙර කුසලයක් හින්දද? නෑ. අකුසලයක් නිසා. ඒක ප්‍රියයිද? නෑ. ආන්න ඒක නිසා ඒ චක්ඛු විඤ්ඤාණය **අකුසල විපාක චක්ඛු විඤ්ඤාණයක්. කුසල විපාක** නම් හොඳ යාන වාහන ඒවාගේම ලස්සන ප්‍රියකරු දර්ශන වගේ දේවල් දකින්න ලැබෙනවා. ඒක නිසා මේ චක්ඛු විඤ්ඤාණය කියන එක ලේසියට කිව්වාට ඒකට ලැබෙන්නේ ඔක්කොම හොඳ ඒවත් නොවෙයි. නරක ඒවත් නොවෙයි. ඒකෙන් දෙකම හම්බවෙනවා. ඒක නිසා එක විඤ්ඤාණයක් **අකුසල විපාකයක්** අනිත් එක **කුසල විපාකයක්**.

ඒවගේම තමයි මහා නරක සද්ද අහන්න ලැබෙනවා. සමහර සද්ද අහන්න හරි භයානකයි. ඒක නිසා ඒ භයංකාර සද්ද අහන්න ලැබෙන්නේ **අකුසල විපාකයක්** නිසා. හොඳ දේවල් අහන්න ලැබෙන්නේ **කුසල විපාකයක්** නිසා. එතකොට සෝත විඤ්ඤාණත් දෙකක් තිබෙනවා.

ඊළඟට ඝාණ විඤ්ඤාණ. වැදිච්ච ගමන් වමනෙට එන ගඳක් දැනෙනවා. ඒ පෙර පිනක් හින්දද? යන්න බලන්න mortuary එකට. ලංකාවේ mortuary එහෙකට යන්න ඕනෑ. ඒ mortuary තියෙන්නේ අමු කුණු ගඳක්. ඒවගේම තිබෙනවා post-mortem වලට නැවත ගොඩ ගන්න මිනී. ඔය post-mortem තියන සමහර දොස්තර වරුන්ට ඇතිවෙන ඝාණ විඤ්ඤාණ **අකුසල විපාක** ඝාණ විඤ්ඤාණ.

දැන් අපි කෑම කනකොට **කුසල විපාකත්** එනවා. **අකුසල විපාකත්** එනවා. එහෙමත් තිබෙනවා. සමහර වෙලාවට කුණු කරවල අනන කොට ගඳයි, කන කොට රසයි. එකක් අකුසල විපාකයි, අනිත් එක කුසල විපාකයි. ජිව්හා විඤ්ඤාණය **කුසල විපාකයි,** ඝාණ විඤ්ඤාණය **අකුසල විපාකයි.** ඩූරියන් කනකොට ඝාණ විඤ්ඤාණය **අකුසල විපාකයි,** ජිව්හා විඤ්ඤාණය **කුසල විපාකයි.**

ඒවගේම තමයි සැප පහසුව උනත් රළු පොළවක ඉන්නකොට ඒක **අකුසල විපාකයි.** ඒවගේම injection ගහනකොටත් අකුසල විපාක කාය විඤ්ඤාණ පහළ වෙනවා. Acupuncture කරනකොටත් කටු ගහන වෙලාවට **අකුසල විපාකයි,** අවසානයේ massage කරනකොට **කුසල විපාකයි.**

ඒක නිසා මේ විපාක සිත් 32 න් සිත් 10 ක්, එනම් චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය - කියන විඤ්ඤාණ 5 **කුසල** සහ **අකුසල** වශයෙන් පහළ වෙන සිත් 10ක්.

දැන් මේ සියලුම විඤ්ඤාණ එනම් චක්ඛු විඤ්ඤාණ හොඳ වශයෙන් හෝ නරක වශයෙන් - සෝත විඤ්ඤාණ හොඳ වශයෙන් හෝ නරක වශයෙන් - ඝාණ විඤ්ඤාණ ජිව්හා විඤ්ඤාණ හොඳ වශයෙන් හෝ නරක වශයෙන් හෝ කාය විඤ්ඤාණ හොඳ වශයෙන් හෝ නරක වශයෙන් ලැබෙන්නේ කුමක් නිසාද? ඒවා ලැබෙන්නේ සංඛාර නිසයි. අපි කරලා තිබෙන්නා වූ දේවල් වල හැටියට තමයි මේ විඤ්ඤාණ පහළ වෙන්නේ. සමහර ඒවා තිබෙනවා අපිට අතහරින්න බෑ. ඒවා අනිවාර්යයෙන්ම එනවා.

- කුසල් සහ අකුසල් වශයෙන් පහළ වෙන චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය කියන විඤ්ඤාණ වලට කියනවා **ද්විපඤ්චවිඤ්ඤාණ** කියලා. මේවා කුසල වශයෙන් 5 යි. අකුසල වශයෙන් 5යි. මේවාට දෙපස් විඤ්ඤාණ කියලත් කියනවා.

<u>ද්විපඤ්ච විඤ්ඤාණ</u>

| | |
|---|---|
| කුසල විපාක චක්ඛු විඤ්ඤාණය. | අකුසල විපාක චක්ඛු විඤ්ඤාණය. |
| කුසල විපාක සෝත විඤ්ඤාණය. | අකුසල විපාක සෝත විඤ්ඤාණය. |
| කුසල විපාක ඝාණ විඤ්ඤාණය. | අකුසල විපාක ඝාණ විඤ්ඤාණය. |
| කුසල විපාක ජිව්හා විඤ්ඤාණය. | අකුසල විපාක ජිව්හා විඤ්ඤාණය. |
| කුසල විපාක **කාය විඤ්ඤාණය.** | අකුසල විපාක **කාය විඤ්ඤාණය.** |

මේ ජීවිතයේදි කර්මයක් කළහම ඒ කර්මය නැවත ප්‍රතිසන්ධියක් ලබා දෙන්න ඉස්සෙල්ලා මේ ජීවිතියේදීම විපාක දෙනවා. ඒකට කියනවා **දිට්ඨධම්මවේදනීය කර්ම විපාක** කියලා. ඒවත් එන්නේ ප්‍රවෘත්ති කාලයේදී. වෙන කර්මයකින් උප්පතියක් ලබා දෙවලා ඒ ඉන්න කාලයේදී, ඒ විපාකය විදින කාලයේදී ඒ ජීවිතිය තුල තව කර්මයක් කරලා ඒකට ඉස්සරහදි ප්‍රතිසන්ධි වශයෙන් විපාක විඤ්ඤාණයක් හදලා දෙන්න කලියෙන් මේ ළඟ ළඟම විපාක දෙවන ස්වභාවයක් තිබෙනවා. ඒක **දිට්ඨධම්මවේදනීයයි.**

ප්‍රවෘත්ති විපාක කියන ඒවා මේ ජීවිතියේදීත් හම්බ වෙනවා. එහා ජීවිතියේදීත් හම්බවෙනවා. තව යම් යම් තැන් වලත් හම්බවෙනවා. ඒ හැම තැනම මේ විපාක විඤ්ඤාණ තමයි වැඩ කරන්නේ. අපිට ශාරීරික වශයෙන් පහසුකම් අපහසුකම් හමුවෙනවා. ඒ ඔක්කොමත් විපාක.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස ලෙඩරෝග - කැන්සර් වගේ ඒවා?

<u>පිළිතුර</u> - ඇත්ත ලෙඩක් හැදුනොත් ඒක විපාකයක්. ඇත්තටම කැන්සර් එකක් නම් ඒක විපාකයක්. බොරු ලෙඩනම් එහෙම නෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **දිට්ඨධම්මවේදනීය** කර්ම වල කැලි ඉතුරු වෙන්නේ නැතුව ඒක ඉවර වෙනවද?

<u>පිළිතුර</u> - මෙහෙම එකක් තිබෙනවා. මොකක් හරි පිංකමක් කළහම ඒකෙ විපාක එනවා. නමුත් ඒ කර්මයේ **දිට්ඨධම්ම** වශයෙන් ලැබෙන විපාකය මේ භවයේදී පමණයි ලැබෙන්නේ. චුතියෙන් පස්සේ දිට්ඨධම්ම වශයෙන් ලැබිය යුතුව තිබු කර්ම විපාක අහෝසි වෙනවා.

<u>ප්‍රශ්නය</u> - අහෝසි කර්ම කියන්නේ ඒවාද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔව්, අහෝසි කම්ම වලින් එකක් ඒක. ඒ ටික අහෝසියි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දැන් දොස්තර මහත්තුරු ගාවට එන කකුල් කැඩිච්ච අය කෑ ගසනවා ඇහෙනකොට ඒවා අකුසල විපාක. එතකොට ඒවා සනීප කරහම?

<u>පිළිතුර</u> - එතකොට රැස් වෙන්නේ කුසල කර්ම.

ධර්මයේ තිබෙනවා 'අකුසල ධර්මයන් කුසල ධර්ම ඇතිකර ගැනීමට හේතු වෙනවා' කියලා. දොස්තරලා උනත් අපි හාමුදුරුවෝ උනත් හැමෝටම එකයි. අපිට ඉතාමත් අසාධ්‍ය ලෙඩ්ඩුන්ට පිරිත් කියන්න යන්න වෙන අවස්ථාවල් තිබෙනවා. ඒ අයට ඉඳ ගන්නත් බෑ. අපිත් සමහර වෙලාවට හිටගෙන පිරිත් කියන්නේ. ඉඳගන්න පුටුවක් නෑ. ඒවා ඔක්කොම අකුසල විපාක. ඒ උනාට අපි පිරිත් කියලා කුසල කර්මයක් හදාගෙන ශාන්තියක් කරලා එනවා.

දැන් හාමුදුරුවරු මළමිනී බලලා භාවනා කරන්න යනවා. භවනාව කියන්නේ වෙන කාරණයක් නමුත් ඒ දර්ශනය අකුසල විපාක. ඒ අන්තිම අසෝභන අප්‍රිය දේවල් බලලා ඒ අකුසල විපාකය පාවිච්චි කරනවා කුසලයක් හදාගන්න. ඒක ඇත්තටම recycle කරනවා වගේ වැඩක්.

ඒක බුදුරජාණන්වහන්සේ සූත්‍ර දේශනාවලත් ලෝක මට්ටමෙන් දේශනා කරනවා. යම්කිසි කෙනෙක් දුප්පත්වෙලා උපදිනවා. දුප්පත් වෙලා උපදිනවා කියලා කියන්නේ එයාගේ ගෙදර මුකුත්ම නෑ. කෑම බීම නෑ. අඳින්න පළඳින්න නෑ. නමුත් එයා ඒක තේරුම් ගන්නවා. එයා ඒක තේරුම් අරගෙන හොර මැරකම් කරන්නේ නැතුව උත්සාහවත් වෙලා 'මම පෙර අකුසල් කරපු නිසා තමයි මෙහෙම උනේ' කියලා හිතාගෙන එයා නරක වැඩ කරන්නේ නැතුව හොඳ වැඩ කරගෙන යහපත් වැඩ කරගෙන හොඳට ජීවිතිය පවත්වනවා සහ කුසල් කරනවා. එයා ඒ කුසල් කරන්නෙම 'මම මේකෙන් ගොඩ එන්න ඕනෑ' කියලා හිතාගෙන. එහෙම එයා ධෛර්යමත් වෙලා හොඳ පැත්තට යනවා.

සමහර අය අනිත් පැත්තටත් යනවා. ඒ කියන්නේ තමන්ට දැන් යාන වාහන මිල මුදල් අතට පයට සේවකයෝ ඔක්කෝම තිබෙනවා. ඒවා කුසල විපාක. කුසල විපාක ආවට පස්සේ ඒවා තමන්ගේ බලයට පාවිච්චි කරනවා. අනිත් අයට පීඩා කරන්න පාවිච්චි කරනවා. අනිත් අයට ගහනවා බණිනවා. සමහර විට මිනී මරණවා. ඒවා කරලා ඒ අය කුසල විපාකය විඳින ගමන් අකුසලය වැඩි කරනවා.

මේ තමයි **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියලා කියන විදිය.

තව එකක් තිබෙනවා. කුසල විපාකයක් හැටියට විපාක විඤ්ඤාණය හදන්නත් පුළුවන්. ඒවාගේම තමයි රූපත් ඒකට අනුව කර්මයෙන් හදලා දෙනවා. දැන් මෙතැනදී කියන්නේ **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන කථාවයි. තව ඉස්සරහදි තියෙනවා කොහොමද රූප සකස් වෙන්නේ කියලා. මේ තමයි **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැන වැඩ කරන විදිය.

<u>ප්‍රශ්නය</u> - එතකොට ස්වාමීන්වහන්ස හිතට වේදනාවල් එනකොට?

<u>පිළිතුර</u> - හිතටත් වේදනාවල් එනවා. හිතටත් වෛරය වගේ අප්‍රසන්න දේවල් එනවා. අපි මේ වෙලාවේ කාට හරි ද්වේශ සහගතව කුණුවෙච්ච සිතෙන් දැවිච්ච තැවිච්ච උණුවෙච්ච කැකෑරිච්ච සිතෙන් අපි තවත් කෙනෙකුට දොස් කියන්න බනින්න තලන්න පෙළන්න ගහන්න හිතනවා. ඒ හිතනකොට ඒ හිතත් එක්ක අපේ ශරීරය රෞද්‍ර වෙලා ගොරෝසු වෙලා තද වෙලා කර්කශ වෙලා මහා අමුතුම විදියේ වේදනාකාරී ගතියක් හැදෙනවා අපේ ශරීරයේ. සමහරුන්ට දත් පූට්ටු වෙනවා, ඔළුව තද වෙනවා. ඒ හැම එකක්ම වේදනාවක්. ඒ වේදනාව විඳින්නේ ඒ සිතුවිල්ල හදපු කෙනා.

යම්කිසි කෙනෙක් අකුසල සිතක්, තද බල ගොරෝසු දැවෙන හිතක් හදනවා කියලා කියන්නේ ඒ හිතට සාපේක්ෂව අපේ ඇඟේ හදනවා මහා රෞද්‍ර කර්කශ වේදනා කාරී ස්වභාවයක්. ඒ වේදනාව හදනකොට ඒ කායික වේදනාව පෙර විපාකයක් ඇදලා දෙන්න හේතු වෙනවා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එවෙලේ හිතපු එක විපාකයක් නෙමෙයි නේද?

<u>පිළිතුර</u> - පෙර විපායකුත් එනවා, ඒවෙලාවේ එකකුත් එනවා.

මෙතැන ඇත්තටම ඇතිවෙන්නේ චිත්තජ රූප ස්වභාවයක්. මේ කථාව හොඳට තේරුම් ගන්න. දැන් අපිට මහා තරහ හිතක් ඇතිවෙනවා. ඒ තරහා හිතට සාපේක්ෂව ඒ රෞද්‍ර ගොරෝසු කර්කශ හිතින් මවලා දෙන කර්කශ ගොරෝසු වේදනාකාරී මහා අමුතු අප්‍රසන්න රූප ටිකක් හදලා දෙනවා අපේ ඇඟේ. ඒ අප්‍රසන්න රූප ටික නිසාම අපේ කයේ හැදෙනවා අමුතු වේදනා ගතියක්. සමහරු වෙවුලනවා. සමහරුන්ට කථා කරගන්න බැරිවෙනවා. වචන පටලැවෙනවා. සමහරුන්ට දැවිල්ල හැදෙනවා. එහෙම ගතියක් ඇතිවෙනවා. ඒක ඒ වේලාවේ තමන්ටම දැනෙනවා. සමහරු ඔලුවේ අත ගහගෙන ඉන්නේ. ඒ කියන්නේ පීඩාවකින් ඉන්නේ. ඒ පීඩාව එයා විඳිනවා ඒ අවස්ථාවේ. ඒ කායික දුකක් විඳින්නේ. ඒ කායික දුක ඒ වේලාවේ කරපු එකක් හරි නැත්නම් ඒ වෙලාවේ කරපු එක වෙනත් එකකට එතැනට ගලාගෙන එන්න හරි හේතු වෙච්ච විපාකයක්.

සමහර වෙලාවට තිබෙනවා මෙන්න මෙහෙම කාරණයක්. සමහරුන්ගේ තිබෙනවා හිතේ නුරුස්නා ගතියක්, ඉඳගෙන ඉන්නත් බෑ. යන්නත් බෑ. පපු ප්‍රදේශය දැවෙනවා වගේ. පරිසරයත් අමුතුයි, හිතට කිසිම සතුටක් දැනෙන්නේ නෑ. පණ ගතියක් නෑ. කිසිම fit එකක් නැති ගතියක් දැනෙනවා. හිතලා බැලුවහම මම කාටවත් මේ වෙලාවේ කරපු

එකකුත් නෑ. ඊයේ වෙච්ච දේකුත් නෑ. මට කවුරුවත් මුකුත් කරලත් නෑ. හැබැයි විඳවන ගතියක් තිබෙනවා. ඒක චෛතසික වශයෙනුත් පීඩාව කායික වශයෙනුත් හරිම අමිහිරි අප්‍රසන්න ගතියක් තිබෙනවා. ඔන්න ඔහොම ගතියක් ඇතිවෙනවා. ඒ කායික වශයෙන් ඇතිවෙන්නේ විපාකයක්. ඒක අපිට තේරෙන්නේ නෑ, අපි කර්ම විපාක ගැන දන්නා නුවණ තිබෙන අය නොවෙන නිසා. ඉතින් කාට හරි ඒක හරවන්න බලනවා. නමුත් එයාත් මුකුත් කරලාත් නෑ. ඒ පාර අපි හිතනවා වෙන කෙනෙක් වෙන්න ඇති කියලා. නමුත් ඒ අය මුකුත් කරලත් නෑ. ඉතින් ඔහොම ඕක කරකැවී කරකැවී තිබෙනවා. එහෙම අවස්ථා තිබෙනවා ඔය ජීවිතවල. සමහර වෙලාවට මිනිස්සු ඒවගේ අවස්ථා ආවහම දොස්තර මහත්වරු හොයාගෙන යනවා.

Anxiety කියල එකක් තිබෙනවා. Anxiety ආවට පස්සේ අස්ථාවර සැක සංකා සහිත ඔළුවත් බර වෙච්ච පහළට නැමිච්ච ගතියක් තිබෙනවා. ඒක එයාට පීඩාවක්. ඒ කායික වශයෙන් දැනෙන පීඩා අකුසල විපාක.

<u>ප්‍රශ්නය</u> - පෙර කරපු ඒවගේ විපාක නේද ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - පෙර ජීවිතියේ ඒවයෙනුත් එනවා. මේ ජීවිතේ කරපු ඒවගෙනුත් එනවා. අපිට හරියට aim කරන්න බෑ. සමහරුන්ට අතේ මොකක් හරි රිදුමක් තිබෙනවා. බෙහෙත් ගත්තට හරි යන්නේ නෑ. සමහර විට hypnotize කරනවා. එතකොට පිටි පස්සට පිටිපස්සට ගිහිල්ලා බැලුවහම කාටහරි පොල්ලකින් ගහපු එකක් අහුවෙනවා. එහෙම තිබෙනවා.

ඒවගේම භාවනා කරගෙන යනකොට හොඳට හිත පවත්වනකොට ඒකෙන් ඇතිවෙන්නේ සැහැල්ලු ගතියක්. සනීපයක්. බරක් දැනෙන්නේ නෑ. ඒවා කුසල විපාක. ඒක නිසා අපි තේරුම් ගන්න ඕනෑ කුසල විපාක වැඩ කරන්නේ කොහොමද කියලා. මේවා ප්‍රවෘති කාලයේ ඇතිවෙන්නාවූ **කුසල සහ අකුසල විපාක විඤ්ඤාණ.**

හොඳයි, මේ තමයි **සඞ්ඛාර පච්චයා විඤ්ඤාණං** කියන තැන අපි මේ පින්වතුන්ට විස්තර කියලා දීපු විදිය. ඉතින් මේක අභිධර්ම විස්තරයකුත් එක්ක සූත්‍ර කොටසුත් එක්කාසු කරලා ඒ තැන්වලට ගැලපෙන්න තමයි මේ පින්වතුන්ට කියලා දුන්නේ. මේකේ තවත් පැතිකඩ තිබෙනවා, විස්තර විභාග වැඩියි. ඒවත් අපි ඉස්සරහදි බලමු. සැම දෙනාටම ධර්ම අවබෝධය - නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි